ජාතික ඖෂධ නියාමන අධිකාරිය - 2019
-----------------------------------------------

**1.1** වියාචනය කළ මතය
-------------------------

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් හා සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.2** මතය වියාචනය සඳහා පදනම
---------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

**1.3** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්
------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5** මූල්‍ය ප්‍රකාශන

**1.5.1** ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරියේ ගිණුම් තැබීමේ දෝෂ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ආදායම රු.9,728,822 ක් අඩුවෙන්ද, වියදම රු.16,766,765 ක් වැඩියෙන්ද දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.26,495,587 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | ඉතා අධික කුවිතාන්සි ප්‍රමාණයක් අත්තිකාරම් ලැබීම් හා ආදායම් වශයෙන් වෙන් කර හඳුනා ගැනීම අපහසු බැවින් හා වියදම් වැඩියෙන් ගිණුම් ගතවී තිබීම හේතුවෙන් මෙම වැරදි සිදුවී ඇති බව හා එම වැරදි ඉදිරි වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | මෙම වැරදි නිවැරදි කරමින් 2020 වර්ෂයේ ගිණුම් පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට උපචිත වියදම් රු.2,127,713 ක් ගිණුම්ගත කර නොතිබීමේ වරද නිවැරදි කිරීමේදී පෙර වර්ෂ ගැලපුම් ගිණුමට එම වටිනාකම දෙවරක් හර කර තිබුණි. | මෙම වැරදි ඉදිරි වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | මෙම වැරදි නිවැරදි කරමින් 2020 වර්ෂයේ ගිණුම් පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | ඉකුත් වර්ෂයට අදාළ ගිණුම්කරණ වැරදි නිවැරදි කිරීමේදී එකතුව රු.2,976,895 ක අගයක් ඉදිරියට ලද අත්තිකාරම් ගිණුමට ගැලපිය යුතුව තිබුණද එසේ ගැලපීමකින් තොරව අත්තිකාරම් ගිණුම තුලනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. මෙවැනි ගිණුම්කරණ දෝෂ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු අත්තිකාරම් ගිණුම් ශේෂය හා ඊට අදාළ උපලේඛනය අතර රු.121,182,845 ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙම වැරදි ඉදිරි වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | මෙම වැරදි නිවැරදි කරමින් 2020 වර්ෂයේ ගිණුම් පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අධිකාරිය පිහිටුවනු ලැබූ 2015 වර්ෂයේ සිටම අමාත්‍යාංශය සතු ගොඩනැගිලි, රථ වාහන, රසායනාගාරය, රසායනාගාර උපකරණ, කාර්යාල උපකරණ හා ලී බඩු සහ සවිකිරීම් ඇතුළු ස්ථාවර වත්කම් රාශියක් අධිකාරිය විසින් පරිහරණය කරන නමුත් එම වත්කම් අධිකාරිය වෙත පවරා ගෙන වත්කම්වල සාධාරණ අගය ගිණුම්වල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | 2015 වර්ෂයේ සිටම අමාත්‍යාංශය සතු වත්කම් අධිකාරිය විසින් පරිහරණය කළද අධිකාරිය සතුව ස්ථිර සේවක මණ්ඩලයක් නොසිටීම හේතුවෙන් එම වත්කම් තක්සේරු කිරීමට හා ගිණුම්ගත කිරීමට නොහැකි වූ බව, 2020 වර්ෂයේ රට තුළ ඇති වූ Covid-19 වසංගත තත්වය හේතුවෙන් එම කටයුතු තව දුරටත් ප්‍රමාද වූ බව හා එබැවින් මෙම වත්කම් හැකි ඉක්මනින් තක්සේරු කර ගිණුම් ගත කරන බව. | මෙම වත්කම් තක්සේරු කර, පවරා ගැනීමෙන් අනතුරුව ගිණුම් ගත කරමින් 2020 වර්ෂයේ ගිණුම් පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුළදී කෙරීගෙන යන වැඩ (Work in Progress) වෙනුවෙන් ගෙවා තිබුණු රු.5,142,750 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් යෙදවීමක් ලෙස දක්වා නොතිබුණි. එසේම මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ගැලපුම් අගයක් වශයෙන් දක්වා ඇති රු.900,468,913 ක් සඳහා විස්තරාත්මක උපලේඛන හා පැහැදිලි කිරීම් විගණනයට ඉදිරිපත් නොකෙරුණු බැවින් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි නිවැරදිතාවය විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය. | මෙම වැරදි ඉදිරි වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | මෙම වැරදි නිවැරදි කරමින් 2020 වර්ෂයේ ගිණුම් පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |

### 1.5.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| (අ) ගෙවිය යුතු සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් ගිණුම | 242,840 | (242,840) | 485,680 | ශේෂ පරීක්ෂාවන් සිදු කර සිදුවී ඇති අඩුපාඩු හඳුනාගත යුතුව ඇති බව. | වෙනස හා වෙනසට හේතු හඳුනාගෙන වැරදි තිබේ නම් නිවැරදි කිරීමට හෝ සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් ගිණුම | 535,187 | (535,187) | 1,070,374 | -එම- | -එම- |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) භාණ්ඩාගාර අයබදු ප්‍රතිපාදන ගිණුම | 160,486,545 | 168,623,641 | 8,137,096 | -එම- | -එම- |
| (ඈ) ගෙවිය යුතු උපයන විට බදු | 170,312 | - | 170,312 | -එම- | -එම- |

**1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂයය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු.මි | | | |
| (අ) අත්තිකාරම් ලැබීම් ගිණුමේ ශේෂය | 121.1 | උපලේඛන හා කාල විශ්ලේෂණ | අත්තිකාරම් ගිණුමේ ශේෂය හා උපලේඛන ඉදිරිපත් කළ හැකි ශේෂයන් අතර පවතින වෙනස සඳහා තවමත් උපලේඛන පිළියෙල කළ නොහැකිවී ඇති බව. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කරන අවස්ථාවේදීම උපලේඛන හා කාල විශ්ලේෂණ පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ගැලපුම් අගය | 900.4 | විස්තරාත්මක උපලේඛන හා පැහැදිලි කිරීම් | මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියල කිරීමේදී සිදු වූ වරදක් මත අදාළ වෙනස්කම් සිදුවී ඇති බව හා ඉදිරි වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී වැරදි නිවැරදි කරන බව. | -එම- |
| (ඇ) අධිකාරිය වෙත නිකුත් කළ විගණන විමසුම් 12 | 43.1 | විගණන විමසුම් සඳහා පිළිතුරු | පිළිතුරු නොදුන් විගණන විමසුම් සඳහා හැකි ඉක්මනින් පිළිතුරු ඉදිරිපත් කරන බව. | විගණන විමසුම් සඳහා නියමිත දිනට පිළිතුරු ඉදිරිපත් කළ යුතුය. |
| (ඈ) නිෂ්පාදනාගාර ලියාපදිංචිය සඳහා වූ අයදුම්පත් | - | අයදුම්පත් අඩංගු ලිපිගොනු 6 ක් | මෙම අයදුම්පත් භාරව කටයුතු කළ නිලධාරිනිය ස්ථාන මාරුවක් ලබා ඉවත්ව ගොස් ඇති බැවින් හා එම ලිපිගොණු භාර නිලධාරින්ද මේ වන විට ආයතනයෙන් ඉවත්ව ඇති බැවින්ද එම ලිපිගොනු විගණනය වෙත ඉදිරිපත් කළ නොහැකිවී ඇති බව හා එම ලිපිගොනු පිළිබඳ සොයා බලා හැකි ඉක්මනින් විගණනය වෙත ඉදිරිපත් කරන බව. | අදාළ ලිපි ගොනු විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) සමාලෝචිත වර්ෂය තුළදී ඖෂධ ලියාපදිංචිය සඳහා ලැබී තිබුණු අයදුම්පත් සංඛ්‍යාව 2,097 ක්වූ නමුත් නිකුත් කළ ලියාපදිංචි සහතික සංඛ්‍යාව පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | - | නිකුත් කළ ලියාපදිංචි සහතික සංඛ්‍යාව | නිකුත් කළ ලියාපදිංචි සහතික සංඛ්‍යාව පිළිබඳ තොරතුරු ඉදිරියේදී මාර්ගගත ක්‍රමය සම්පූර්ණ වූ පසු නිසියාකාරව ලබාදිය හැකි බව. | අදාළ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |
| (ඊ) සමාලෝචිත වර්ෂය තුළදී නැවත ලියාපදිංචිය සඳහා ඉදිරිපත් වූ වෛද්‍ය උපකරණ 250 ක් වෙනුවෙන් නිකුත් කළ ලියාපදිංචි සහතික පිළිබඳ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | - | නිකුත් කළ ලියාපදිංචි සහතික සංඛ්‍යාව | නිකුත් කළ ලියාපදිංචි සහතික සංඛ්‍යාව පිළිබඳ තොරතුරු ඉදිරියේදී මාර්ගගත ක්‍රමය සම්පූර්ණ වූ පසු නිසියාකාරව ලබාදිය හැකි බව. | අදාළ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |
| (උ) ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් සමාලෝචිත වර්ෂය තුළදී අධිකාරිය සම්බන්ධයෙන් සිදුකර තිබුණු Benchmarking වැඩසටහන සම්බන්ධයෙන් එම සංවිධානය විසින් නිකුත් කර තිබුණු වාර්තාවේ සඳහන් ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරයේ රසායනාගාර පරීක්ෂණ සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කර තිබුණු නිර්දේශයන් 37 හි වර්තමාන ප්‍රගතිය විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | - | ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්දේශයන්හි වර්තමාන ප්‍රගතිය | මේ සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයේ Benchmark tool හි අඩංගු නිර්ණායක රාශියක් සම්පූර්ණ කිරීම සඳහා ආයතනය වෙත ඉදිරිපත් කර ඇති බව, මෙම නිර්ණායක සපුරාලීම සඳහා මූලික අවශ්‍යතා රාශියක් අත්‍යවශයෙන්ම සම්පූර්ණ කළ යුතු බව, අවශ්‍යතා සපුරන තෙක් එම නිර්ණායක සම්පූර්ණයෙන්ම සපුරාලීම අපහසු බව, කෙසේ වෙතත් දැනට තිබෙන පහසුකම් අනුව එම නිර්ණායක සපුරාලමින් පවතින අතර එසේ සපුරන ලද නිර්ණායක ලෝක සෞඛ්‍ය සංවිධාන ඇගයීම් කණ්ඩායම මගින් ඉදිරියේදී නැවත අධ්‍යයනය කර තවදුරටත් උපදෙස් ලබා දීම සිදු කරනු ඇති බව. | ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්දේශයන්හි වර්තමාන ප්‍රගතිය විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |

## 1.6 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම්

| නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත | | | |
| (i) 43 (2) වන වගන්තිය | ඖෂධ ඇගයීම් කමිටුවේ අනුමැතිය ලබා නොගෙන ඖෂධ නව ලියාපදිංචි කිරීමේ අයදුම්පත් 10 ක් සඳහා තාවකාලික ලියාපදිංචි සහතික නිකුත් කර තිබුණි. තවද ආයතන 02 ක් වෙත ඖෂධ අයිතම 14 ක් සඳහා ලියාපදිංචි සහතික නිකුත් කිරීමෙන් පසුව අනුමැතිය සඳහා ඖෂධ ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කර තිබුණි. | ඖෂධ ලියාපදිංචිය සඳහා වූ අයදුම්පත් කිසිවක් ඇගයීමට පෙර ඖෂධ ඇගයීම් කමිටුව (MEC) වෙත ඉදිරිපත් කිරීමක් මෙම අවදියේදී සිදු නොකරන ලද බව. | පනත ප්‍රකාරව කටයුතු කරමින් ලියාපදිංචි සහතික නිකුත් කළ යුතුය. |
| (ii) 51 වගන්තිය | ඇගයීම ආරම්භකර නොතිබුණු විදේශීය නිෂ්පාදනගාර 04 කට අදාළ ඖෂධ වර්ග 04 ක් සඳහාද, නිෂ්පාදනාගාර සඳහා අනුමැතිය ලබාදීමට ප්‍රථමයෙන් විදේශීය නිෂ්පාදනාගාර 22 ක ඖෂධ වර්ග 34 ක් සඳහාද ලියාපදිංචි සහතික නිකුත් කර තිබුණි. තවද, වර්ෂයක් තුළදී යහපත් නිෂ්පාදන පරිචය පිළිබඳ පරීක්ෂාවක් පැවැත්විය යුතුව තිබුණු විදේශීය නිෂ්පාදනාගාරයක් සඳහා වර්ෂ 05 ක් ඉක්මවන තෙක් එම පරීක්ෂාව පවත්වා නොතිබුණු නමුත් එහි නිපදවන ඖෂධ සඳහා අවස්ථා 06 කදී ලියාපදිංචි සහතික නිකුත් කර තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | -එම- |

| | | | |
|---|---|---|---|
| (iii) 58 , 59 , 82 හා 83 වගන්ති | පනතේ සඳහන් විධිවිධානවලට අනුකූල නොවන ලෙස 2019 වර්ෂයේදී අධිකාරිය විසින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව, වෛද්‍ය සැපයීම් අංශය හා අනෙකුත් රජයේ හා පෞද්ගලික ආයතන වෙනුවෙන් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි 516 ක් නිකුත් කර තිබුණි. | මේ සම්බන්ධයෙන් අදාළ අංශයෙන් කරන ලද විමසීමේදී මෙවැනි විරෝධතා නොදැක්වීමේ ලිපි නිකුත් කර ඇති බව පිළිගත් අතර එවැනි විරෝධතා නොදැක්වීමේ ලිපි නිකුත් කිරීම විවිධ අත්‍යවශ්‍යය හේතූන් මත සිදු වන බව. | පනතේ දක්වා ඇති අවශ්‍යතා සඳහා පමණක් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කළ යුතුය. නොඑසේ නම් පනත සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iv) 59 (4) (ආ) වගන්තිය | සමාලෝචිත වර්ෂය තුළදී සාම්පල් ලබා ගැනීමකින් තොරව ඖෂධ නව ලියාපදිංචිය සඳහා ලැබී තිබුණු අයදුම්පත්වලට අදාළව තාවකාලික ලියාපදිංචි සහතික 99 ක් හා වර්ෂ 05 ක් සඳහා නිකුත් කරන සම්පූර්ණ ලියාපදිංචි සහතික 49 ක්ද, ඖෂධ නැවත ලියාපදිංචිය සඳහා ලැබුණු අයදුම්පත් වලට අදාළව ලියාපදිංචි සහතික 29 ක්ද නිකුත් කර තිබුණි. | ලියාපදිංචියට ලැබෙන සියලුම ඖෂධ අයදුම්පත් ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයේ ඇගයීමට පත් කිරීමට පහසුකම් රසායනාගාරයේ නොමැති බව, එබැවින් නිෂ්පාදකයා විසින් ලබාදෙන පරීක්ෂණ වාර්තා හා වෙනත් ආයතන මගින් ලබාගන්නා පරීක්ෂණ වාර්තා මත පදනම් වී ලියාපදිංචිය ලබාදෙන බව. | පනත ප්‍රකාරව කටයුතු කරමින් ලියාපදිංචි සහතික නිකුත් කිරීමට අවශ්‍ය පහසුකම් සලසා ගත යුතුය. |
| (v) 64 වන වගන්තිය | 2020 වර්ෂයේදී ඇගයීම් සිදුකර තිබුණු ආයතන 03 ක ඖෂධ අයිතම 25 ක් ඇගයීම සඳහා වූ ඉල්ලීම් ඖෂධ ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් නොකර සම්පූර්ණ ලියාපදිංචි සහතික නිකුත් කර තිබුණි. | ඖෂධ ලියාපදිංචිය සඳහා වූ අයදුම්පත් කිසිවක් ඇගයීමට පෙර ඖෂධ ඇගයීම් කමිටුව (MEC) වෙත ඉදිරිපත් කිරීමක් මෙම අවදියේදී සිදු නොකරන ලද බව. | පනත ප්‍රකාරව කටයුතු කරමින් ලියාපදිංචි සහතික නිකුත් කළ යුතුය. |
| (vi) 83(4)(ආ) වගන්තිය | සමාලෝචිත වර්ෂය තුළදී සාම්පල් ලබා ගැනීමකින් තොරව වෛද්‍ය උපකරණ නව ලියාපදිංචිය සඳහා ලැබී තිබුණු අයදුම්පත් 579 ක් සඳහා තාවකාලික ලියාපදිංචි සහතික 246 ක් නිකුත් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී රසායනාගාරය විසින් පරීක්ෂා කර තිබුණු සාම්පල් ප්‍රමාණය 01 ක් පමණක් විය. | වෛද්‍ය උපකරණ වල නියැදි පරීක්ෂාවට ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයේ පහසුකම් නොමැති බව, නිෂ්පාදකයා විසින් නිකුත් කරන රසායනික වාර්තාව, සායනික ඇගයීම් වාර්තාව හා නිෂ්පාදන රටෙහි උපකරණ ලියාපදිංචි කිරීමේ ජාතික ආයතනය මගින් නිකුත් කරන ලද ලියාපදිංචි සහතිකය පදනම් කරගෙන ලියාපදිංචිය සිදු කරනු ලබන බව. | පනත ප්‍රකාරව කටයුතු කරමින් ලියාපදිංචි සහතික නිකුත් කිරීමට අවශ්‍ය පහසුකම් සලසා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (vii) 109 වන වගන්තිය | පනතේ සඳහන් නොවන හේතූන් මත සමාලෝචිත වර්ෂය තුළදී ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි 89 ක් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත නිකුත් කර තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය තුළදී ඖෂධ අයිතම 03 ක් සඳහා එකම සැපයුම්කරු හෝ නිෂ්පාදකයා වෙත නැවත නැවතත් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කර තිබුණු අවස්ථා 06 ක් විය. | මේ සම්බන්ධයෙන් අදාළ අංශයෙන් කරන ලද විමසීමේදී මෙවැනි විරෝධතා නොදැක්වීමේ ලිපි නිකුත් කර ඇති බව පිළිගත් අතර එවැනි විරෝධතා නොදැක්වීමේ ලිපි නිකුත් කිරීම විවිධ අත්‍යවශ්‍යය හේතූන් මත සිදු වන බව. | පනතේ දක්වා ඇති අවශ්‍යතා සඳහා පමණක් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කළ යුතුය. නොඑසේ නම් පනත සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (viii) 119 (1) වගන්තිය | වලංගු බලපත්‍රයක් නොමැතිව ව්‍යාපාර කටයුතු සිදුකරනු ලබන එක් ඔසුසලක් සහ වලංගු කාලසීමාවට අදාළව බලපත්‍රය යාවත්කාලීන කර නොගෙන ව්‍යාපාර කටයුතු සිදුකරන ඔසුසල් 23 ක් පැවති බව 2020 අගෝස්තු 27 වන දින කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටි ඔසුසල් 26 ක් පිළිබඳව සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය. එසේම භෞතික පරීක්ෂාව සිදුකරන අවස්ථාවේදී ලියාපදිංචි ඖෂධවේදියෙකු සේවයේ යෙදී නොසිටි ඔසුසල් 12 ක්ද, ඔසුසැල් බලපත්‍රය හා ඖෂධවේදී ලියාපදිංචි සහතිකය ප්‍රදර්ශනය කර නොතිබුණු ඔසුසල් 15 ක්ද, ඖෂධවේදීන්ගේ ඡායාරූප ප්‍රදර්ශනය කර නොතිබුණු ඔසුසල් 05 ක්ද, වායුසමීකරණ යන්ත්‍ර භාවිතයකින් තොරව පවත්වාගෙන යමින් සිටි ඔසුසල් 04 ක්ද වූ අතර ඡායාරූප පිටපත් යන්ත්‍රය ස්ථානගත කර තිබුණු ස්ථානයේම ඖෂධ තබා තිබුණු ඔසුසල් 02 ක්ද විය. | බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදය වෙනස් කොට මාර්ගගත ක්‍රමයට හුවමාරු වීමේදී සිදු වූ පමාවන් සහ තාක්ෂණික දෝෂ මෙන්ම, කොවිඩ් 19 හේතුවෙන් රටේ උද්ගතව පැවති තත්ත්වය අනුව බලපත්‍ර යාවත්කාලීන කිරීම නිසි අවස්ථාවේදී සිදු වී නොමැති බව, සීමාවලින් තොරව කටයුතු කළ හැකි පරිසරයක් නිර්මාණය වූ වහාම මෙම අඩුපාඩු නිවැරදි කිරීමට අවශ්‍ය පියවරගන්නා බව. | විධිමත්ව හා කාර්යක්ෂමව බලපත්‍ර නිකුත් කළ යුතුය.ඔසුසල් නියාමනය විධිමත් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | **2019** ඔක්තෝබර් **14** දිනැති අංක **2145/1** දරන ගැසට් පත්‍රයේ ඇතුළත් නියෝගයන්හි **I** වන කොටසෙහි **8** වන නියෝගය | ඖෂධයක තාවකාලික ලියාපදිංචිය සඳහා වන කාලසීමාව අවසන්වීමට පෙර සමාලෝචිත වර්ෂය තුළදී ඖෂධ අයිතම **07** ක් සඳහාද, **2020** වර්ෂයේදී ඖෂධ අයිතම **25** ක් සඳහාද සම්පූර්ණ ලියාපදිංචිය ප්‍රදානය කර තිබුණි. එසේම තාවකාලික බලපත්‍රයේ වලංගු කාල සීමාව ඉක්මවීමට වර්ෂ **02** කට ආසන්න කාලයක් පැවතියදී ආයතන **03** ක ඖෂධ අයිතම **24** ක් සඳහා සම්පූර්ණ ලියාපදිංචිය පිරිනමා තිබුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් අධිකාරිය විසින් විශේෂ විමර්ශනයක් සිදු කරන ලද අතර ඒ සම්බන්ධයෙන් වන සියලුම නිර්දේශ මේ වන විට ක්‍රියාත්මක කර ඇති බව, එමෙන්ම තව දුරටත් මෙවැනි සිදුවීම් සිදු නොවීමට අදාළ නිලධාරීන් දැනුවත් කර ඇති බව හා ඒ සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාපටිපාටි සකස් කර මේ වන විට ක්‍රියාත්මක කරමින් පවතින බව. | පනතෙහි සහ අදාළ ගැසට් පත්‍රයේ ඇතුළත් නියෝග ප්‍රකාරව කටයුතු කරමින් ලියාපදිංචිය ලබා දිය යුතුය. |
| (ඇ) | **2019** මැයි **15** දිනැති අංක **2123/35** දරන අති විශේෂ ගැසට් පත්‍රය | ඖෂධ **61** ක් සඳහා උපරිම සිල්ලර මිලක් නියම කර තිබුණු නමුත් අධිකාරිය විසින් අවස්ථා **03** කදී නිකුත් කර තිබුණු ඖෂධ **03** ක ලියාපදිංචි සහතිකවල එම උපරිම සිල්ලර මිලට වඩා වැඩි මිලක් නියම කර තිබුණි. | ගැසට් පත්‍රයේ නියම කර ඇති උපරිම සිල්ලර මිලට වඩා වැඩි උපරිම සිල්ලර මිලක් ඒ ඒ ඖෂධයේ ලියාපදිංචි සහතිකවල සඳහන් කර තිබීම මගින් වරදක් සිදුවී ඇති බව හා අදාළ ඖෂධ **03** කිසියම් අත්වැරදීමකින් ගැසට් පත්‍රය මඟින් මිල නියාමනය කරන ලද ඖෂධ ලෙස හඳුනා නොගැනීම නිසා මෙම වරද සිදුවී ඇති බව. | ගැසට් පත්‍රයේ නියමයන් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | **1958** අංක **15** දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතේ **10** වන වගන්තිය සහ පනතේ **16** වන වගන්තිය | අධිකාරිය විසින් **2016** ජනවාරි මාසයේ සිට **2018** සැප්තැම්බර් මාසය දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා සේවක අර්ථ සාධක අරමුදල් දායකය නියමිත දිනට ප්‍රේෂණය කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.**388,261** ක අධිභාරයක් ගෙවීමට සිදුවී තිබුණි. | **2019** වර්ෂය තුළදී අධිකාරිය සතුව ස්ථිර සේවක මණ්ඩලයක් නොසිටීම නිසා ආයතනයේ දෛනික රාජකාරි කටයුතු සිදු කිරීම ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් ආයතනයේ පුහුණු අභයාසලාභීන් යොදා ගනිමින් සිදු කරන ලද බව හා මේ වන විට අධිකාරිය සතු ස්ථිර කාර්ය මණ්ඩලයක් බඳවාගන තිබෙන බැවින් මින් ඉදිරියට එවැනි අධිභාර ඇති නොවන ආකාරයෙන් නියමිත දිනයන්වලදී නියමිත මුදල් ප්‍රේෂණය කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | 2005 අංක 06 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | අධිකාරිය විසින් 2016 හා 2017 වර්ෂ වෙනුවෙන් ගෙවිය යුතු එකතු කළ අගය මත බදුගෙවීම ප්‍රමාද කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.36,864,100 ක අධිභාරයක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පනවා තිබුණි. එසේම 2020 වර්ෂයේ පළමු, දෙවන හා තෙවන කාර්තු තුන සඳහා එකතුකළ අගය මත බදු නිවැරදිව හඳුනාගෙන 2021 ජනවාරි 11 දින වන විටත් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි. | මෙම අධිභාර මුදල පැනවීම පිළිබද මේ වන විට දේශීය අදායම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කරමින් පවතින අතර ඒ පිළිබඳ එකගත්වයකට පැමිණි වහාම ඒ සම්බන්ධයෙන් අදාළ ක්‍රියාමාර්ග ගන්නා බව, එමෙන්ම පසුගිය වසරෙහි රට තුළ ඇති වූ Covid -19 වසංගත තත්ත්වය හේතුවෙන් 2020 මාර්තු මස අග සිට මාස කිහිපයක කාල සීමාවක් අධිකාරියේ දෛනික කටයුතු කරගන යාමට නොහැකි වීම නිසා අධිකාරියේ එකතු කළ අගය මත බදු දේශීය අදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීම ප්‍රමාද වූ බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2006 අංක 10 දරන ආදායම් බදු පනතේ 113 වැනි වගන්තිය | අධිකාරියේ ආදායම් බදු දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ප්‍රමාදවී ප්‍රේෂණය කිරීම හේතුවෙන් 2016/2017 වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.1,361,759 ක අධිභාරයක් ගෙවීමට සිදුවී තිබුණි. | අධිකාරිය සතුව ස්ථිර සේවක මණ්ඩලයක් නොසිටීම මත අවසන් ගිණුම් පිළියෙල කිරීම ප්‍රමාද වූ බැවින් අදායම් බදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීම ප්‍රමාද වූ බව, ඒ නිසා රු.1,361,759 ක අධිභාරයක් ගෙවීමට අධිකාරියට සිදුවූ බව, නැවත මෙවැනි ප්‍රමාදවීම් ඇති නොවන අයුරින් වර්ෂ අවසාන ගිණුම් පිළියෙල කර අදාළ ගෙවීම් සිදු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (උ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 7.4.1 වගන්තිය | වාර්ෂිකව විගණන කමිටු රැස්වීම් වාර 04 ක් පැවැත්විය යුතු වුවද, 2019 වර්ෂය සඳහා එකදු රැස්වීමක්වත් පවත්වා නොතිබුණි. | 2019 වර්ෂය සඳහා ස්ථිර සේවක මණ්ඩලයක් නොසිටීමත්, 2019 වර්ෂය අවසන් වන විට ස්ථිර සේවක මණ්ඩලයක් බඳවා ගත්තද විගණන කමිටුවක් පැවැත්වීම සඳහා ප්‍රමාණවත් කාලසීමාවක් නොතිබීමත් මත 2019 වර්ෂය සඳහා විගණන කමිටු පැවැත්වීමට අධිකාරියට නොහැකි වූ බව, මෙම අඩුපාඩු මගහරවා ගැනීම මේ වන විට කටයුතු කරමින් පවතින බව හා 2020 වර්ෂය සඳහා විගණන කමිටු 2 ක් පවත්වා ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඌ) | 2018 නොවැම්බර් 14 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයට අදාළ මාස 12 තුළ අධිකාරිය සතු ජංගම ගිණුමේ රු.මිලියන 200 ත් රු.මිලියන 900 ත් අතර පැවති අතිරික්ත මුදල් ඵලදායී ලෙස ආයෝජනය කර නොතිබුණි. | 2019 වර්ෂයේ මුල් කාර්තුව තුළ අධිකාරියේ බැංකු ගිණුමේ පැවති මුදල් ආයෝජනය නොකර බැංකු ගිණුමේ ශේෂය පවත්වා ගෙන ගියද, 2019 මැයි 2 දින සිට අධිකාරියට මාසික වියදම් සඳහා අවශ්‍ය මුදල් ශේෂ රඳවා ගනිමින් ඉතිරි මුදල් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කිරීමට කටයුතු කර ඇති බව, එමෙන්ම මේ වන විට භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තවදුරටත් ඉතිරි මුදල් ලංකා බැංකුවේ Sweeping Facility and ZBA Facility යටතේ ආයෝජනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.795,694,791 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු .809,170,663 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.13,475,872 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ලියාපදිංචි ආදායම අඩුවීම හා පරිපාලන හා අනෙකුත් වියදම් ඉහල යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. කෙසේ වුවද මුදලින් හා සෘජුවම බැංකුවට ලැබෙන ලියාපදිංචි ගාස්තු, බලපත්‍ර ගාස්තු ඇතුළු සියළු ආදායම් නිසි ගිණුම් කාලපරිච්ඡේදයට හඳුනාගෙන ගිණුම්ගත කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබුණි. ලැබෙන සියළු මුදල් අත්තිකාරම් ලැබීම් ගිණුමකට බැර කර පසුව ආදායම් හඳුනාගැනීමේ ක්‍රමවේදයක් අනුගමනය කර තිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ ආදායම නිවැරදිව හඳුනාගෙන නොතිබුණි.

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතෙහි 38 (2)(අ) වගන්තිය ප්‍රකාරව, අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකව පැවති ජාතික තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය අධිකාරිය වෙත පවරා ගැනීමට හා එහි වත්කම් තක්සේරු කර අධිකාරියේ ගිණුම්වලට ගැනීමට කටයුතු කර නොතිබුණි. | අධිකාරිය සතුව ස්ථිර සේවක මණ්ඩලයක් නොසිටීම හේතුවෙන් ජාතික තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය සතු වත්කම් තක්සේරු කිරීමට හා ගිණුම්ගත කිරීමට නොහැකි වූ බව හා මෙම වත්කම් හැකි ඉක්මනින් තක්සේරු කර ගිණුම් ගත කරන බව. | මෙම වත්කම් තක්සේරු කර අධිකාරිය වෙත පවරාගැනීමෙන් පසු ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතෙහි 41 (2), 66 (2) හා 87 (2) වගන්ති ප්‍රකාරව, වෛද්‍ය විද්‍යාව, ඖෂධ වෛද්‍ය විද්‍යාව හා ඖෂධවේදය හෝ වෙනත් අදාළ විෂයයන් පිළිබඳ උපාධියක් සහිත නිලධාරියෙකු, ඖෂධ නියාමන (Medicine Regulatory) අංශයේ, වෛද්‍ය උපකරණ නියාමන (Medicine Devices Regulatory) අංශයේ හා සීමාස්ථ නිෂ්පාදන නියාමන (Border Line Production Regulatory) අංශයේ ප්‍රධානීන් ලෙස පත්කර නොතිබුණි. | දැනට එම අංශ වල සේවය කරන නිලධාරීන් අතරින් ඉහලම සුදුසුකම් හා පළපුරුද්ද සහිත නිලධාරීන් ඖෂධ නියාමන අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරීගේ සෘජු අධීක්ෂණය යටතේ එම අංශවල ප්‍රධානීන් ලෙස පත් කර ඇති බව හා පනතට අනුව අදාළ සුදුසුකම් සහිත නිලධාරීන් බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතෙහි 61,84 (2), 85,103 (2),104 වගන්ති ප්‍රකාරව, ලියාපදිංචිය ප්‍රතික්ෂේප කළ ඖෂධ, ලියාපදිංචි කළ හා ලියාපදිංචිය ප්‍රතික්ෂේප කළ වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන ගැසට්කර මහජනතාවට දැනුම් දීමට කටයුතු කර නොතිබුණි. | 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරී පනතේ 60 (2) වගන්තිය ප්‍රකාරව 2019.10.09 දිනැති අංක 2144/20 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් අධිකාරිය විසින් ලියාපදිංචි කරන ලද ඖෂධ ඇතුළත් නියමයන් ප්‍රකාශයට පත්කර ඇති බව. | අධිකාරිය විසින් ලියාපදිංචි කරන ලද ඖෂධ ඇතුළත් නියමයන් ප්‍රකාශයට පත්කර ඇති නමුත් ලියාපදිංචිය ප්‍රතික්ෂේප කළ ඖෂධ, ලියාපදිංචි කළ හා ලියාපදිංචිය ප්‍රතික්ෂේප කළ වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන ගැසට්කර මහජනතාවට දැනුම්දීමට කටයුතු කර නොතිබුණු බැවින් පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතෙහි 123 වගන්තිය ප්‍රකාරව, අධිකාරිය වෙත ඉදිරිපත් කරන අභියාචනා අසා තීරණය කිරීම සඳහා අභියාචනා කමිටුවක් පිහිටුවා නොතිබුණි. | අමාත්‍යවරයා විසින් අභියාචනා කමිටුව පත් කළ යුතු බැවින් ඒ සම්බන්ධයෙන් අමාත්‍යවරයාව දැනුවත් කර ඇති බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුළදී වෛද්‍ය උපකරණ 861 ක් නව ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කර තිබුණු අතර 2020 අගෝස්තු 27 දින වන විට ඉන් වෛද්‍ය උපකරණ 247 ක් සඳහා පමණක් ලියාපදිංචි සහතික නිකුත් කර තිබුණි. ඉතිරි වෛද්‍ය උපකරණ 614 ක් සඳහා ලියාපදිංචිය ලබාදීමට අපොහොසත් වී තිබුණි. | වෛද්‍ය උපකරණ ලියාපදිංචි කිරීම සඳහා විශේෂඥ ආයතනවලට යවා උපකරණ පිළිබඳ සායනික ඇගයීම් තොරතුරු ලබාගෙන ලියාපදිංචියට අදාළ ඉතිරි ඇගයීම් කර ලියාපදිංචිය සිදුකරනු ලබන අතර ඒ සඳහා යම් කාල සීමාවක් ගත වන බව, සායනික ඇගයීම් සඳහා විශේෂඥයින් මෙම ආයතනයට කැඳවා අයදුම්පත් ඇගයීම් කරන | නිශ්චිත කාල සීමාවක් තුළ ඇගයීම් සිදුකර ලියාපදිංචිය ලබාදීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අතර 2020 මාර්තු වන විට Covid-19 වසංගතය හේතුවෙන් නිලධාරීන් ආයතනයට කැඳවීමට නොහැකිවූ බව. | |
| (ඊ) | 2019 ජනවාරි 01 දින සිට 2019 අප්‍රේල් 26 දින දක්වා වූ කාලය තුළදී ඖෂධ නව ලියාපදිංචි කිරීම් සඳහා ලැබෙන අයදුම්පත් ලියාපදිංචි කරන ලේඛනය අස්ථානගතවී තිබුණු අතර ඉන් පසු කාලසීමාව තුළදී ඖෂධ නව ලියාපදිංචිය සඳහා සාම්පල් 1,168 ක් හා ඖෂධ නැවත ලියාපදිංචිය සඳහා සාම්පල් 440 ක් ලැබී තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂය තුළදී රසායනාගාරය විසින් පරීක්ෂාකර තිබුණු සාම්පල් ප්‍රමාණය 60 ක් පමණක් වූ අතර ඉතිරි සාම්පල් 1,548 ක් පරීක්ෂා කිරීමට අපොහොසත් වී තිබුණි. | දක්වා ඇති කාල සීමාව සඳහා ඖෂධ නව ලියාපදිංචි කිරීම් සඳහා ලැබෙන අයදුම්පත් ලියාපදිංචි ලේඛනය අස්ථාන ගත වුවද එම තොරතුරු Excel පිටපතක් මගින් විගණනය වෙත ඉදිරිපත් කරන ලද බව, ඉහත කාල සීමාව තුළ ලියාපදිංචි කිරීම සඳහා සාම්පල් 13 ක් පරීක්ෂණාගාරයට යොමු කර ඇති අතර එම සියලුම සාම්පල් සඳහා තත්ත්ව වාර්තා නිකුත් කර ඇති බව. | ඉදිරිපත් කරනු ලබන සියලු සාම්පල් පරීක්ෂා කළ හැකි වන පරිදි රසායනාගාරයේ ධාරිතාවය වර්ධනය කළ යුතුය. |
| (උ) | ජාතික ඖෂධ නියාමන අධිකාරී පනතේ 119 (4) වගන්තිය තුළ ඔසුසල් ලියාපදිංචියට හා බලපත්‍ර නිකුත් කිරීමට ගත කළ යුතු නිශ්චිත කාලසීමාවක් නිර්ණය කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී ඔසුසල් 119 ක බලපත්‍ර නිකුත් කිරීම සඳහා මුදල් අයකළ දින සිට බලපත්‍ර නිකුත් කිරීමට මාස 04 සිට වර්ෂ 01 දක්වා වූ විවිධ කාලපරාසයන් ගත කර තිබුණු අතර ඔසුසල් බලපත්‍ර මුද්‍රණය කිරීමෙන් පසු අදාළ බලධාරියාගේ අත්සනින් යුතුව බලපත්‍රය නිකුත් කිරීම සඳහා මාස 01 සිට මාස 10 දක්වා වන කාලයක් ගතකර තිබුණු අවස්ථා 117 ක් විය. බලපත්‍ර මුද්‍රණය කළ දින සිට නිකුත් කිරීම දක්වා මෙතරම් කාලයක් ගතකර තිබීමට පිළිගත හැකි හේතු ඉදිරිපත් නොකෙරුණි. | මූලික ලිපි ගොනු පරීක්ෂාව හා බලපත්‍ර කෙටුම්පත් කිරීම සඳහා අවශ්‍ය වන කළමනාකරණ සහකාර නිලධාරීන් නොමැතිව මාස 6 කට අධික කාලයක් මෙම අංශය කාර්යාල කාර්ය සහායක නිලධාරීන් මගින් වැඩ ආවරණය කිරීමට සිදුවීම හේතුවෙන්ද, නව රෙගුලාසි හඳුන්වාදීමේදී බලපත්‍රයේ ආකෘතින් වෙනස්වීම මත අදාළ දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමට දීර්ඝ කාලයක් ගතවීම හේතුවෙන්ද මෙම ප්‍රමාදයන් සිදුවූ බව හා මෙම කටයුතු මේ වන විට යාවත්කාලීන කර ඇති බව. | අයදුම්පත් ඉදිරිපත් කළ දින සිට සහතික හා බලපත්‍ර නිකුත් කිරීම සඳහා ගත කළ යුතු සම්මත කාලයක් හඳුනාගත යුතුය. ඒ අනුව පිළියෙල කරන ලද සැලැස්මකට අනුව කටයුතු කරමින් ලියාපදිංචි සහතික සහ බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රමාදය අවම කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | 2019 සැප්තැම්බර් 01 දින සිට මාර්ගගත පරිගණක ස්වයංක්‍රීයකරණ පද්ධතිය (Online Automation System) මගින් පියවර 03 ක් යටතේ ඖෂධ බලපත්‍ර (සිල්ලර හා තොග) නිකුත් කිරීම සඳහා අධිකාරිය විසින් කටයුතු කර තිබුණි. නමුත් ඖෂධ හිමියන්ට මෙම ක්‍රමය පිළිබඳ අවබෝධයක් නොමැති වීම, තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම ප්‍රමාණවත් නොවීම, කාර්යක්ෂම පරිගණක අයිතම නොමැති වීම හා අන්තර්ජාල පහසුකම් පිළිබඳ ගැටළු ආදී වූ කරුණු හේතුවෙන් මෙම පද්ධතිය User Friendly නොවීම සම්බන්ධයෙන් ඖෂධ හිමියන් විසින් අදහස් ප්‍රකාශකළ අතර ඒ හේතුවෙන් ඖෂධ බලපත්‍ර ලබා ගැනීමේ උනන්දුව තවදුරටත් හීනවී තිබුණි. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ අගෝස්තු 31 දින වන විට අධිකාරිය වෙත ලද ඖෂධ බලපත්‍ර ආදායම රු.30,842,902 කින් පහළ ගොස් තිබුණු අතර මෙයට මාර්ගගත පරිගණක ස්වයංක්‍රීයකරණ පද්ධතියේ ක්‍රියාකාරිත්වය යථාවත් නොවීමද බලපා තිබුණි. | ඖෂධ හිමියන් විසින් පද්ධතිය User Friendly නොවීම පිළිබඳව මෙතෙක් අධිකාරිය වෙත සෘජු පැමිණිලි සිදු කර නැති බව, තවදුරටත් මේ සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇති බව, මෙම පද්ධතිය ඉතා සංකීර්ණ පද්ධතියක් වන අතර මේ තුළ යම් ප්‍රමදවීම් පැවතියද මේ වන විට හැකිතාක් නිවැරදි කිරීම් සිදු කිරීමට පියවර ගෙන ඇති බව හා මෙම නිවැරදි කිරීම් සඳහා යම් කාල සීමාවක් ගත වූ බව, භාවිතයේදී ඇති වූ ප්‍රායෝගික ගැටළු හේතුවෙන් අධිකාරියට යම් ආදායමක් අහිමිවීමක් සිදු වී ඇති බව හා මේ වන විට මෙම තත්වය මගහරවා ගැනීමට කටයුතු කරමින් පවතින බව. | ස්වයංක්‍රීයකරණ පද්ධතිය නිර්මාණය කිරිමේ ගිවිසුමට අනුව අදාළ නිවැරදි කිරීම් එම ආයතනය ලවා ඉටු කරවා ගත යුතුය. |
| (එ) | ඖෂධ බලපත්‍ර ලබා ගැනීම සඳහා මුදල් ගෙවා තිබුණු නමුත් බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රමාදය සඳහා හා බලපත්‍ර ලබා ගැනීමකින් හෝ බලපත්‍ර අලුත් කර ගැනීමකින් තොරව ව්‍යාපාර කටයුතු සිදුකිරීම වැළැක්වීම සඳහා විධිමත් ක්‍රමවේදයක් අධිකාරිය විසින් ස්ථාපිත කර නොතිබුණු අතර සමස්ථ දිවයින පුරා සිදු කළ යුතු ඖෂධ වෙළෙඳසැල් පිළිබඳ අධීක්ෂණ කටයුතු ප්‍රමාණවත් පරිදි සිදු කර නොතිබුණි. | ඖෂධ පරීක්ෂණ නිලධාරී තනතුරු 20 ක් අනුමත වී ඇති නමුත් බඳවා ගැනීමේ පටිපාටිය හා වැටුප් පරිමාණය සඳහා වන නිර්දේශයන් වැටුප් කොමිසම විසින් ලබාදීම ප්‍රමාදවීම හේතුවෙන් එම තනතුර සඳහා නිලධාරීන් බඳවා ගැනීමට නොහැකි වී ඇති බව, අංශයට අවශ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් ලබා ගැනීම සඳහා ඉල්ලීම් සිදු කර ඇති බව හා බලපත්‍ර ලබා දීමේ ප්‍රමාදය වැලැක්වීම සඳහා මාර්ගගත පද්ධතියේ පවතින අඩු පාඩු නිවැරදි කර දෙන ලෙස ඉල්ලීම් කර ඇති බව. | විධිමත්ව හා කාර්යක්ෂමව බලපත්‍ර නිකුත් කිරීමට අවශ්‍ය වන්නාවූ පහසුකම් සපයා ගත යුතු අතර ඖෂධ නියාමනය විධිමත් කළ යුතුය. |

**3.2** මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය (National Drugs Quality Assurance Laboratory) විසින් පර්යේෂණාගාරයේ ප්‍රමිතිය සම්බන්ධයෙන් අනුකූලතා තක්සේරු පිළිබඳ සහතිකය ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය වෙත 2020 පෙබරවාරි 06 දින අයදුම්පතක් ඉදිරිපත් කර තිබුණු නමුත් විගණිත දිනය වූ 2020 දෙසැම්බර් 31 දින වන විටත් එම ප්‍රමිති සහතිකය ලබාගැනීමට අපොහොසත් වී තිබුණු අතර ලබාගෙන ඇති වෙනත් ප්‍රමිති සහතික පිළිබඳ තොරතුරුද විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය වෙත 2020 පෙබරවාරි 06 දින අයදුම්පතක් යොමු කළද මෙම ප්‍රමිති සහතිකය ලබා ගැනීම සඳහා තවදුරටත් සපුරාලිය යුතු අවශ්‍යතා මෙතෙක් සපුරා නොතිබීම සහ පසුගිය වසර පුරා පැවති සහ තවදුරටත් පවතින covid-19 වාතාවරණය හේතුවෙන් එම ප්‍රමිති සහතිකය ලබා ගැනීම තවදුරටත් ප්‍රමාද වීම නොවැලක්විය හැකි බව. | ප්‍රමිති සහතිකය ලබා ගැනීම සඳහා තවදුරටත් සපුරාලිය යුතු අවශ්‍යතා හැකි ඉක්මනින් සම්පූර්ණ කර එය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් සමාලෝචිත වර්ෂය තුළදී අධිකාරිය සම්බන්ධයෙන් සිදුකර තිබුණු Benchmarking වැඩසටහනට අනුව, ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය පිළිබඳව පරීක්ෂා කර තිබුණු නිර්ණායක 07 ක් අර්ධ වශයෙන් ක්‍රියාත්මක කර තිබුණු බවත් නිර්ණායක 02 ක් සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර නොතිබුණු බවත් එම සංවිධානය විසින් නිරීක්ෂණය කර තිබුණි. | මේ සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයේ Benchmark tool හි අඩංගු නිර්ණායක රාශියක් සම්පූර්ණ කිරීම සඳහා ආයතනය වෙත ඉදිරිපත් කර ඇති බව, මෙම නිර්ණායක සපුරාලීම සඳහා මූලික අවශ්‍යතා රාශියක් අත්‍යවශයෙන්ම සම්පූර්ණ කළ යුතු බව, අවශ්‍යතා සපුරන තෙක් එම නිර්ණායක සම්පූර්ණයෙන්ම සපුරාලීම අපහසු බව, කෙසේ වෙතත් දැනට තිබෙන පහසුකම් අනුව එම නිර්ණායක සපුරාලමින් පවතින අතර එසේ සපුරන ලද නිර්ණායක ලෝක සෞඛ්‍ය සංවිධාන ඇගයීම් කණ්ඩායම මගින් ඉදිරියේදී නැවත අධ්‍යයනය කර තවදුරටත් උපදෙස් ලබා දීම සිදු කරනු ඇති බව. | ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්දේශයන් පරිදි අදාළ නිර්ණායක හැකි ඉක්මනින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2013 වර්ෂයේදී ඖෂධ හා වෛද්‍ය උපකරණ සඳහා සාම්පල් පරීක්ෂා කිරීමේ ප්‍රගතිය පිළිවෙලින් සියයට 97 ක් හා සියයට 100 ක් වුවද, එය 2019 වර්ෂය වන විට පිළිවෙලින් සියයට 73 ක් හා සියයට 58 ක් දක්වා අඩු වී තිබුණි. 2013 වර්ෂයේ නව ඖෂධ ලියාපදිංචි කිරීම සඳහා සාම්පල් 217 ක් පරීක්ෂා කර තිබුණු නමුත් 2019 වර්ෂයේදී පරීක්ෂා කර තිබුණු සාම්පල් ප්‍රමාණය 60 ක් පමණක් විය. | ලියාපදිංචිය සඳහා ලබා දුන් සාම්පල විශ්ලේෂණය කර වාර්තා නිකුත් කර ඇති බව. | ඉදිරිපත් කරනු ලබන සියලු සාම්පල් පරීක්ෂා කළ හැකි වන පරිදි රසායනාගාරයේ ධාරිතාවය වර්ධනය කළ යුතුය. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළදී රු.1,724,196 ක් වැය කර වායුසමීකරණ යන්ත්‍ර 06 ක් , කාර්යාලීය උපකරණ අයිතම 13 කට අදාළ ඒකක 41 ක් හා ඇඟිලි සලකුණු යන්ත්‍ර 02 ක් මිලදී ගෙන තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව, මෙම ප්‍රසම්පාදනයන් වලදී ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කර නොතිබීම, අදාළ පිරිවිතර තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අනුමත කර නොතිබීම, ප්‍රසම්පාදනයන් සඳහා ලංසු වලංගු කාලයක් නියම කර නොතිබීම, ලංසු සුරක්ෂණ හා කාර්යසාධන සුරක්ෂණ ලබාගෙන නොතිබීම, ලංසුකරු වෙත ප්‍රතිග්‍රහණ ලිපි හා සැපයුම්කරු වෙත ගැණුම් ඇණවුම් නිකුත් කර නොතිබීම හා සැපයුම්කරු සමඟ ගිවිසුම්වලට එළඹී නොතිබීම වැනි අඩුපාඩු නිරීක්ෂණය විය. | ආයතනයේ කටයුතු නිසියාකාරව පවත්වාගෙන යාමට අත්‍යවශ්‍යවීම හේතුවෙන් එම ප්‍රසම්පාදන කටයුතු සිදු කරනු ලැබුවද නිසි පුහුණුවක් නොමැති බව හා පසුගිය අතපසුවීම් රාශියක් නිවැරදි කිරීම ආදී වැඩ ප්‍රමාණයක් එක් අයෙකු විසින් සිදු කිරීම හේතුවෙන් මෙම අතපසු වීම් සිදු වී ඇති බව, මේ වන විට මෙම සියලු අඩුපාඩු මගහරවා ගනිමින් නිවැරදිව ප්‍රසම්පාදන කටයුතු කරගන යාමට අදාළ නිලධාරීන් දැනුවත් කර ඇති බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | අධිකාරිය සඳහා පරිගණකගත පද්ධතියක් (Implementation of Document and Work flow Management System – Automation) ස්ථාපිත කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.4,378,726 ක් වැයකර තිබුණු අතර පරිගණකගත පද්ධතිය ස්ථාපිත කිරීම | විගණනයෙන් පෙන්වා දී ඇති කරුණු පිළිබඳව විශේෂ අවධානයක් යොමු කොට එකී අරමුණු ඉටු කර ගැනීමට සැලසුම් සහගතව කටයුතු කරන බව. | පරිගණකගත පද්ධතිය ස්ථාපිත කිරීමට අදාළ වූ ගිවිසුම් ප්‍රකාරව කටයුතු කරමින් අරමුණු කළ සියලු අවශ්‍යතා සම්පූර්ණ වන පරිදි අදාළ වැඩිදියුණු කිරීම් ඉටු කරවා |

| | | |
|---|---|---|
| සඳහා 2018 මැයි 03 දින අදාළ ආයතනය සමඟ ගිවිසුමකට එළැඹී තිබුණි. එදින සිට දින 120 ක් තුළ එනම් 2018 සැප්තැම්බර් 03 දින වන විට ව්‍යාපෘතිය සම්පූර්ණ කර අධිකාරිය වෙත බාරදිය යුතු විය. එසේ වුවද, 2020 දෙසැම්බර් 31 දින වන විටත් සම්පූර්ණ පරිගණකගත පද්ධතිය ක්‍රියාත්මක කරලීම සඳහා අධිකාරිය වෙත බාරදී නොතිබුණි. නියමිත පරිදි දින දීර්ඝ කිරීම්ද සිදු කර නොතිබුණු අතර ව්‍යාපෘති ගිවිසුමේ විශේෂ කොන්දේසි ප්‍රකාරව ප්‍රමාද ගාස්තු රු. 3,196,518 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. සංවර්ධනය කරමින් පවතින පද්ධති අතරින් ඇතැම් පද්ධති තවදුරටත් ආරම්භක අවධියේ (Implementation Stage) පවතින අතර පද්ධතියෙහි සංවර්ධන අවධියේදී (Developing Stage) පද්ධතිය පරිශීලනය කරනු ලබන නිලධාරීන්ගේ අවශ්‍යතාවලට (Requirements) අනුව පද්ධතිය තවදුරටත් වැඩිදියුණු කිරීමටත්, නවීකරණය කිරීමටත් (Modifications) සිදුවී තිබුණි. ආරම්භයේදී පද්ධතිය තුළින් අපේක්ෂිත අරමුණු සහ අවශ්‍යතා නිශ්චිතව හඳුනාගෙන ඒවා ව්‍යාපෘති යෝජනා හා අවශ්‍යතා තුළට ඇතුළත් කර නොතිබීම හේතුවෙන් මෙලෙස වරින්වර එකතු කිරීම් සහ වැඩිදියුණු කිරීම් කිරීමට සිදුවී තිබුණි. | | ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.4** මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2019 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව 235 ක් වූ අතර ඉන් පුරප්පාඩු සේවක සංඛ්‍යාව 84 ක් විය. 2020 දෙසැම්බර් 31 දින වන විට එම පුරප්පාඩු සේවක සංඛ්‍යාව 101 දක්වා ඉහළ ගොස් තිබුණි. එසේම අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් තනතුරු 07 ක් සඳහා බඳවා ගැනීමේ පටිපාටි පිළියෙල කිරීමට හා අනුමත | මේ වන විට අදාළ වගකිව යුතු අංශ සමඟ සාකච්ඡා කරමින් සිටින බව හා බඳවා ගැනීමේ පටිපාටි සකස් කර අනුමත කරවා ගත් වහාම තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කරන බව. | අධිකාරියේ ක්‍රියාකාරිත්වය බාධාවකින් තොරව පවත්වා ගැනීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩල පුරප්පාඩු, අනුමත කාර්ය මණ්ඩලය තුළ විධිමත් ලෙස පිරවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීමට අපොහොසත් වී තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී නවක නිලධාරීන් 51 දෙනෙකු අධිකාරිය වෙත බඳවා ගෙන තිබුණු නමුත් 2020 දෙසැම්බර් 31 දින වන විට ඉන් නිලධාරීන් 17 දෙනෙකුම ඉල්ලා අස්වී තිබුණි. අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට හා බඳවා ගැනීමේ පටිපාටි සංශෝධනය කර නිලධාරීන්ගේ සේවක තෘප්තිය ඇති කිරීම මගින් නිලධාරීන් අධිකාරිය තුළ රඳවා ගැනීම සඳහා කටයුතු කිරීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි. අධිකාරියේ සමස්ථ මෙහෙයුම් හා පරිපාලන කර්තව්‍යයන් කාර්යක්ෂමව ඉටුකර ගත නොහැකිවීම කෙරෙහි මෙම කාර්ය මණ්ඩල ඌනතාවය ප්‍රබල ලෙස බලපා තිබුණි. | | |
| (ආ) | ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරයේ සාම්පල් පර්යේෂණ කටයුතු ඖෂධ විශ්ලේෂකයන් 06 දෙනෙකු විසින් පමණක් සිදු කර තිබුණු අතර 2020 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු රසායනාගාර සහායක නිලධාරියෙකු ඒ සඳහා අනුයුක්ත කර නොතිබුණි. | මෙතෙක් අධිකාරිය වෙත රසායනාගාර සහායකයින් 03 දෙනෙකු ලබා දීමට සෞඛ්‍ය අමාත්‍යාංශය කටයුතු නොකළ බැවින් පරීක්ෂණාගාරයේ කටයුතු බාධා මධ්‍යයේ සිදු කරනු ලබන බව, රසායනාගාර සහයක තනතුරට අදාළ බඳවා ගැනීමේ පටිපාටි සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය මේ වන විට ලැබී ඇති බැවින් ඉදිරියේදී කඩිනමින් බඳවා ගැනීම් සිදු කිරීමට නියමිත බව. | අධිකාරියේ ක්‍රියාකාරිත්වය බාධාවකින් තොරව පවත්වා ගැනීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩල පුරප්පාඩු, අනුමත කාර්ය මණ්ඩලය තුළ විධිමත් ලෙස පිරවීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව, ව්‍යවස්ථාපිත මණ්ඩලවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, 2019 | 2020 වසරෙහි රට තුළ ඇති වූ Covid -19 වසංගත තත්වය හේතුවෙන් 2020 මාර්තු මස අග සිට මාස කිහිපයක කාල සීමාවක් අධිකාරියේ දෛනික කටයුතු කරගෙන යාමට නොහැකි වූ බව, එම කාල සීමාව තුළ ඉතාමත් සුළු සේවක පිරිසක් පමණක් ගෙන්වා ගනිමින් අත්‍යවශ්‍ය දෛනික කටයුතු පමණක් කරගෙන යන ලද බව, මෙම තත්වය | චක්‍රලේඛය ප්‍රකාරව නියමිත දිනට ගිණුම් ඉදිරිපත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මාස 08 ක ප්‍රමාදයකින් පසුව 2020 නොවැම්බර් 11 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි. | යටතේ 2019 අවසන් ගිණුම් පිළියෙල කිරීම ප්‍රමාද වූ බව. | |

**4.2** වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් ක්‍රියාකාරකම්වල කාර්යසාධන නිර්ණායක නිශ්චිතව, ප්‍රමාණාත්මකව මෙන්ම මැනිය හැකි මට්ටමින් දක්වා නොතිබීම හේතුවෙන් එකී ක්‍රියාකාරකම් ඉටු කර ගැනීමේ ප්‍රගතිය නිශ්චිතව ඇගයීමට නොහැකිවූ අතර ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම් 11 කට අදාළ කිසිදු කටයුත්තක් සමාලෝචිත වර්ෂය තුළ ආරම්භ කිරීමට හෝ අපොහොසත්ව තිබුණි. | 2019 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මෙහි පැවති අඩුපාඩු ඉවත් කර ගනිමින් මේ වන විට අධිකාරීයේ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරිමට කටයුතු කර ඇති බව. | ක්‍රියාකාරී සැලැස්ම නිවැරදිව හා විධිමත්ව පිළියෙල කළ යුතුය. කාර්ය සාධන නිර්ණායක නිශ්චිතව, ප්‍රමාණාත්මකව හා මැනිය හැකි මට්ටමින් දැක්විය යුතුය. ක්‍රියාකාරී සැලැසුම්වලට අනුව කටයුතු කළ යුතු අතර අවශ්‍යතාවය පරිදි ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කළ යුතුය. ඒ ඒ ක්‍රියාකාරකම් ඉටුකිරීමේ වගකීම අදාළ නිලධාරීන් වෙත නිශ්චිතව පැවරිය යුතු අතර ඒ පිළිබඳව විධිමත් අධීක්ෂණයක් සිදුකළ යුතුය. |